වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අ.පො.ස.(සා/පෙළ) විභාගයට අදාළ පෙරහුරු ප්‍රශ්න පත්‍රය-2025

85 - ගෘහ ආර්ථික විද්‍යාව

I - කොටස

කාලය - පැය 03යි

අමතර කියවීම් කාලය මිනිත්තු - 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවීමටත්, ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල,දී ඇති 1,2,3,4 යන පිළිතුරු වලින් වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.

1. බාර්ලි අයත්වන සැකරයිඩ් වර්ගය,

1. පෙක්ටින්ය 2. ඉනියුලින්ය 3. මෝල්ටෝස්ය 4. ෆ්රක්ටෝස්ය

2. මෙහි සඳහන් අසම්පූර්ණ ප්‍රෝටීනය කුමක් ද?

1. ඇල්බියුමින් වේ 2. ලෙගියුමින් වේ 3. මයෝසින් වේ 4. කොලැජන් වේ

3. ආන්ත්‍රික යුෂයේ අඩංගු එන්සයිම 2කි.

1. පෙප්ටිඩේස් හා සුක්රේස් 2.ලයිපේස් හා සුක්රෝස්
3.පෙප්සින් හා රෙනින් 4.රෙනින් හා ආන්ත්‍රික ලයිපේස්

4. මුඛය තුලදී ජීර්ණය වීම ආරම්භ වන ආහාරයකි,

1. බදින ලද මාළු 2.යෝගට් 3.තම්බන ලද මුං ඇට 4.තම්බන ලද බතල

5. ලයිසීන් හා මෙතියොනීන් යන ඇමැයිනෝ අම්ල බහුලව අඩංගු ආහාර ද්‍රව්‍යකි.

1. සහල් 2. කිරි 3. මුං ඇට 4. මෑ

6. Z නම් විටමිනයේ කෘත්‍ය කීපයක් පහත දැක්වා ඇත.

- ප්‍රතිඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කිරීම.
- යකඩ අවශෝෂණයට උපකාරී වීම.
- පටක වල මනා පැවැත්මට උපකාරී වීම.
- කොලැජන් නිපදවීම.

Z නම් විටමිනය විය හැක්කේ,

1. විටමින් B_1 ය 2. විටමින් A ය 3. විටමින් D ය 4. විටමින් C ය

7. ගර්භණී අවධියේ දී අයඩීන් ඌණතාවයක දී පෙන්නුම් නොකරන ලක්ෂණයක් වන්නේ,

1. භ්‍රෑණයේ වර්ධනය පසු බෑම 2. පේශි දුර්වල වීම
3. ශ්‍රවණ හා කථන ආබාධ ඇති දරුවන් බිහිවීම 4. හිසකෙස් වර්ධනය දුර්වල වීම

8. ඇමයිලේස් එන්සයිමය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශනයකි,

1. අග්න්‍යාශයික යුෂයේ අඩංගු වේ.
2. බෙටයේ පවතින ඇමයිලේස් ටයලින් වේ.
3. හයිඩ්‍රොක්ලෝරික් අම්ලය මගින් සක්‍රිය වේ.
4. පිෂ්ඨය ජීර්ණයට ඇමයිලේස් උපකාරී වේ.

9. කාබෝහයිඩ්‍රේට් 20g ද ප්‍රෝටීන් 30g ද මේද 5g ද අඩංගු වූ ආහාරයවල ඇති මුළු කිලෝ ජූල් අගය කොපමණද?

1. 1600 KJ කි 2. 1010 KJ කි 3. 1445 KJ කි 4. 1120 KJ කි

10. යීස්ට් වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් පිටි මෝලිය පිපීමේ දී ඒ සඳහා අවශ්‍ය වන උෂ්ණත්වය,

1. 38 C පමණ වේ 2. 37 C පමණ වේ 3. 35 C පමණ වේ 4. 30 C පමණ වේ

11. පහත සඳහන් ප්‍රකාශ අතුරින් පෆ් පේස්ට්‍රිය සම්බන්ධව නිවැරදි වැකිය වන්නේ,

1. පිටි හා මාගරින් අතර අනුපාතය 2 : 1 වේ.
2. සැකසීමේදී ශීතකරණය භාවිතය අවශ්‍ය වේ.
3. මාගරින් පමණක් භාවිතා කරයි.
4. මෙම පේස්ට්‍රිය මගින් පැටිස් සනස් කළ හැකි වේ.

12. පිපුම් කාරක යොදා සැකසූ ආහාර බේක් කිරීමේ දී,

1. ඒකාකාරී උෂ්ණත්වයක් පැවතිය යුතුය.
2. මුලින් අඩු උෂ්ණත්වයක් ලබා දිය යුතුය.
3. මුලින් ඒකාකාරී උෂ්ණත්වයක් ලබාදී පසුව උෂ්ණත්වයක් වැඩි කළ යුතුය.
4. උෂ්ණත්වය අඩු වැඩි කරමින් පිළිස්සීම කළ යුතුය.

13.ආහාර ජීර්ණ ක්‍රියාවලිය, ආරම්භය හා අවසානය පිළිවෙලින් දක්වා ඇත්තේ,

1. මුඛයෙන් හා ගුද මාර්ගයෙනි.
2. මුඛ කුහරයෙන් හා ගුදයෙනි.
3. මුඛයෙන් හා මහා අන්ත්‍රයෙනි.
4. මුඛ කුහරයෙන් හා ක්ෂුද්‍රාන්ත්‍රයෙනි.

14. A – ගර්භණී මවට තන්තු සහිත ආහාර ලබා දිය යුතුය.
B – ගර්භණී අවධියේ දී කැල්සියම් අවශ්‍යතාවය 600mg යකි.
C – ගර්භණී අවධියේ දී යකඩ පරිපූරණය සඳහා ෆෙරස් සල්ෆේට් 100 mg ලබාගත යුතුය.
D – ගර්භණී අවධියේ තෙවැනි ත්‍රෛයි මාසිකයේ දී ශක්ති අවශ්‍යතාවය 360 Kcal ක් ලබා ගත යුතුය.
මින් නිවැරදි ප්‍රකාශනයන් වන්නේ,

1. AD වේ. 2. BCD වේ. 3. AC වේ. 4. BCD වේ.

15. පහත සඳහන් ආහාර තුලින් අඩුම මේදය ප්‍රමාණයක් ලබා ගත හැකි වන ආහාරයකි,
1. කජු 2. පොල් 3. තල 4. රට කජු

16. ඇම්බරැල්ලා චට්නි සෑදීමේ දී විනාකිරි භාවිතය තුලින්,

1. PH අගය උදාසීන මට්ටමට පත් වේ.
2. PH අගය අඩු වී උපස්තරය ආම්ලික මාධ්‍යක් බවට පත් වේ.
3. PH අගය වැඩි වී උපස්තරය ආම්ලික මාධ්‍යක් බවට පත් වේ.
4. PH අගය අඩු වීම නිසා ක්ෂුද්‍රජීවීන් වැඩීම වැඩි වේ.

17. A - ඉදිමාව ඇති වීම B - කෙස් තඹපාට වීම.
C - බර අඩු වීම. D - ආසාදන ඇති වීම.
ඉහත රෝග ලක්ෂණ තුලින් හඳුනාගත හැකි රෝගයකි,
1. ක්වොෂියෝර්කෝර් 2. මැරස්මස්
3. තීව්‍ර මන්දපෝෂණය 4. කාලීන මන්දපෝෂණය

18. ශරීර බර 50kg ද උස 1.5 m වන අයකුගේ BMI අගය අනුව ඔහු,

1. අධි බර තත්වයේ පසුවේ. 2. නියමිත බරහි පසුවේ.
3. ස්ථූලතාවයෙන් පෙළෙයි. 4. මන්දපෝෂණයෙන් පෙළෙයි.

19. යොවුන් වියේ සමස්ථ සංවර්ධනය සලකා බැලීමේ දී පසුබෑමේ ස්වභාවයක් පෙන්නුම් කරනුයේ,

1. මානසික වර්ධනය. 2. කායික වර්ධනය.
3. සමාජීය වර්ධනය. 4. චිත්තවේගී වර්ධනය.

20. ක්ෂරණ අවධිය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. දෛනික ප්‍රෝටීන් අවශ්‍යතාව 72mg පමණ වේ.
2. මෙම අවධියේ දී කැල්සියම් අවශ්‍යතාව අඩුවේ.
3. මූලස්ථ පරිවෘත්තිය වේගය අඩුය.
4. මව්කිරි 1850ml පමණ නිපදවීමට පෝෂක අවශ්‍යතා වැඩිවේ.

21. ස්ත්‍රී පුරුෂ යන දෙපාර්ශවයටම පොදු ද්විතික ලක්ෂණයකි.

1. මස් පිඩු වැඩිවීම 2. කටහඬ මිහිරිවීම
3. බරවැඩිවීම 4. උකුල පළල් වීම

22. ගර්භණී අවධියේ දී ඇතිවිය හැකි සුළු ආබාධ තත්වයක් වනුයේ,

1. පාද ඉදිමුව 2. උස අඩුබව 3. ඇදුම 4. දියවැඩියාව

23. ශ්‍රී ලාංකික දරුවකුගේ සාමාන්‍ය උපත් බර සහ හිසෙහි වට ප්‍රමාණය නිවැරදිව ඇතුලත් වරණය වනුයේ,

1. 2.5 kg – 3.5 kg , 34 cm 2. 2.0 kg – 3.0 kg , 34 cm
3. 3.5 kg – 4 kg , 36 cm 4. 2.2 kg – 3.2 kg , 36 cm

24. 2002 ප්‍රතිශක්තිකරණ වැඩසටහනට අනුව පෙන්ටාවේලනට් එන්නත තෙවන මාත්‍රාව දෙනු ලබන්නේ කවර වයස සම්පූර්න වූ පසුව ද,

1. මාස 04 අවසානයේ 2. මාස 06 අවසානයේ
3. මාස දහඅට අවසානයේ 4. මාස දොලහ අවසානයේ

25. ශුක්‍රාණු නිපදවීම ගබඩා කිරීම සිදුකරෙනුයේ පුරුෂ ප්‍රජනක පද්ධතියේ කුමන කොටස තුළදී ද,

1.වෘෂණ කෝෂ 2. වෘෂණ 3. ශුක්‍ර ප්‍රනාල 4. පුරස්ථ ග්‍රන්ථි

26. කොලොස්ට්‍රම් පිළිබඳ නිවැරදි වරණය වනුයේ,

1. ළදරුවාට ස්වාභාවික ප්‍රතිශක්තිය ලබාදීම.
2. ප්‍රසවයෙන් පසු මුල් සති 06 තුළ ස්‍රාවය වේ.
3. දරුවාගේ වර්ධනයට අවශ්‍ය සියලුම පෝෂක ලබා ගත හැක.
4. සන්තෘප්ත මේද අම්ල අඩංගු බැවින් ජීර්ණයට පහසුවේ.

27. නවජ දරුවා ලෙස හඳුන්වන්නේ,

1. උපතේ සිට මාස දෙක දක්වා කාලය.
2. උපතේ සිට සති 04 දක්වා කාලය.
3. උපතේ සිට අවුරුද්දක් දක්වා කාලය.
4. උපතේ සිට සති 02 දක්වා කාලය.

28. පහත දැක්වෙනුයේ මැහුම් ක්‍රමයක් පිළිබඳ සටහනකි.

- දකුණේ සිට වමට මැසීම සිදුවේ.
- පළමුව වාටිය නවා නූල් ඇදීම කරයි.
- මැස්මේ පළල ඒකාකාරී වීමෙන් අලංකාරය ගෙන දේ.
- ඉදිකටුව ගසන ආකාරය අනුව මෝස්තරය නිර්මාණය වේ.

එම මැහුම් ක්‍රමය වන්නේ,

1. වාටි මැස්ම 2. දම්වැල් මැස්ම 3. බ්ලැන්කට් මැස්ම 4. හීන් නූල් දුවවීම

29. රෙදි පිළි සහ ඇදුම් තැනීම සම්බන්ධ පහත වැකි අතුරෙන් නිවැරදි වැකිය තුමක් ද?

1. ළදරු උරහිස මැසීමේදි ප්‍රංශ මූට්ටුව යොදාගනී.
2. පයිපින් කිරීම හා බුලියන් මැස්ම ළදරු ඇඳුම් මැසීමට සුදුසු විසිතුරු මැහුම් ක්‍රම දෙකකි.
3. බොත්තම් කාස මැසීමේදි බ්ලැන්කට් මැස්ම සහ බොත්තම් කාසි මැස්ම දෙකම යොදා ගනි.
4. දෙපෙති ජන්තු ළදරු ඇදුම් විවරය පියවීමට යොදාගනී.

30. පහත සඳහන් කෙදි අතුරෙන් අර්ධ තෘතීම කෙන්දක් වනුයේ,

1. ටෙරලින් 2. නයිලොන් 3.ඇස්බැස්ටස් 4.විස්කෝස්

31. පතරොම භාවිතයෙන් ඇදුම කැපීමේ නිවැරදි පියවර ඇතුලත් වරණය වනුයේ,

1. රෙද්ද මත පතරොම ඇතිරීම ⟶ අල්පෙනෙති ගැසීම ⟶ දක්කුරේඛා සලකුණු කිරීම ⟶ කැපීම
2. රෙද්ද මත පතරොම ඇතිරීම ⟶ දක්කුරේඛා සලකුණු කිරීම ⟶ අල්පෙනෙති ගැසීම ⟶ කැපීම
3. පතරොම් දක්කුරේඛා සලකුණු කිරීම ⟶ පතරොමරෙද්ද මත ඇතිරීම ⟶ අල්පෙනෙති ගැසීම ⟶ කැපීම
4. රෙද්ද මත පතරොම ඇතිරීම ⟶ අල්පෙනෙති ගැසීම ⟶ කැපීම ⟶ දක්කුරේඛා සලකුණු කිරීම

32. මුල් ළමා වියේ ගැහැනු දරුවෙකුගේ ගවුම මැසීම සඳහා අවශ්‍ය පපුව වටා මිම්ම සහ ඉණවටා මිම්ම පිළිවෙලින් වනුයේ,

1. 60 cm – 55 cm 2. 60 cm – 27 cm
3. 55 cm – 60 cm 4. 27 cm – 60 cm

33. ළමා ගවුම සඳහා පතරොම නිර්මාණයේදී සිසුන් විසින් අනුගමනය කල ක්‍රම කිහිපයක් පහත දැක්වේ.මින් නිවැරදි ක්‍රමය කුමක් ද?

1. පපුව වටා මිනුම 4 න් බෙදා 1 cm ක් එකතු කර ඉදිරිපස සහ පිටුපස මිනුම ලෙස යොදාගනී.
2. දෙවන හරස් මිම්ම 4 cm ක් පහල ඉදිරිපස 12.5 cm ක් ලෙස යොදාගනී.
3. ළමා ගවුම නිර්මාණයේ දී සම්මත මිනුම් යොදා නොගනී.
4. උරහිස පළල ඉදිරිපස 8 cm ලෙසත් පිටුපස 9 cm ක් ලෙසත් යොදාගනී.

34. ඕගන්දි වැනි රෙද්දක මතුපිට අලංකාර කිරීම සඳහා වඩාත් සුදුසු විසිතුරු මැහුම් ක්‍රමයකි.

1. ප්‍රංශ ගැට මැස්ම
2. දිග කොට මැස්ම
3. බුලියන් මැස්ම
4. හුරුළුකටු මැස්ම

35. නිවසකට ස්වභාවික වාතාශ්‍රය ලබාගැනීම සඳහා සුදුසු අනුයෝගි ක්‍රමයකි.

1. වහලයේ තැනින් තැන වීදුරු උළු කැට යොදා ගැනීම.
2. ජනේල සඳහා පාර දෘශ්‍ය වීදුරු භාවිතය.
3. දොරවල් සඳහා පාරභාෂක වීදුරු භාවිතය.
4. කොන්ක්‍රීට් ග්‍රිල් සහ ට්‍රෙලිස් යෙදීම.

36. නිවසේ විසිත්ත කාමරය සඳහා සුදුසු උපාංගයක් නිර්මාණයේ දී අවශ්‍ය වන භෞතික නොවන සම්පතක් වනුයේ,

1. මුදල්
2. ඉඩකඩ
3.දැනුම
4.කාලය

37. ද්විතීයික වර්ණ දෙකක් සම ප්‍රමාණයෙන් මිශ්‍ර කල විට සෑදෙන වර්ණ,

1. තෘතිය වර්ණ වේ.
2. අන්තර්මාධ්‍යමික වර්ණ වේ.
3. උදාසීන වර්ණ වේ.
4. චාතුර්තික වර්ණ වේ.

38. නිවසක කාමර සංවිධානයේ රාශිකරණ මූලධර්මය පැහැදිලිව දැකගත හැකි වනුයේ,

1. නිදන කාමරය මුළුතැන්ගෙයට යාබදව පිහිටුවීම.
2. කෑම කාමරය ගබඩාකාමරයට යාබදව පිහිටුවීම.
3. නානකාමරය මුළුතැන්ගෙයට යාබදව පිහිටුවීම.
4. මුළුතැන්ගෙය කෑම කාමරයට යාබදව පිහිටුවීම.

39. ගෘහයක බාහිර අලංකරණයට සම්බන්ධ නිවැරදි වැකිය වනුයේ,

1. කුඩා ඉඩක් ඇති ගෙමිදුලක් සඳහා අඹ, රඹුටන් වැනි පළතුරු ගස් සිටුවීම.
2. ගෙවත්ත අලංකාර කිරීමේදි අලංකාර මල් පමණක් වැවීම කල යුතුය.
3. ගෙවත්ත අලංකාර කිරීමේදි භූමියේ ඉඩ ප්‍රමාණය හැඩය හා බෑවුම පිළිබඳ පමණක් අවධානය යොමු කල යුතුය.
4. පාංශු සංරක්ෂණ පිළිබඳ පමණක් අවධානය යොමු කිරීම.

40. ගෘහිය අයවැය ලේඛනයක මූර්ත ආදායම් කොටසට අයත් වන්නේ,

- වැටුප්
2. සේවා
3. පොලි
4. බදු

85 -ගෘහ ආර්ථික විද්‍යාව

II - කොටස

<u>පළමුවන ප්‍රශ්නය</u> සහ තවත් ප්‍රශ්න <u>හතරක්</u> ඇතුලුව ප්‍රශ්න <u>පහකට</u> පිළිතුරු සපයන්න.

01. නිශාන්ති විසින් නගරයේ පාසලක හෙල බොජුන් හලක් පවත්වාගෙන යනු ලබන්නීය.ඇයට සහාය සඳහා තම සැමියා සහ මව එක්වෙයි.තිලිණිගේ දියණිය එම පාසලේම 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. භෝජනාගාරය ඉතා ප්‍රසන්නව හා පැහැදිලි කළමණාකරණයකින් යුක්තවේ. දියණිය විසින් මසන ලද උපාංග බොජුන් හලට අලංකරණයක් හා ප්‍රයෝජනයක් ගෙන දෙනු ලැබේ.

1. බොජුන් හලේ අලෙවිය සඳහා යෝග්‍ය දේශීය (සිංහල) ආහාර වර්ග 02 ක් ලියන්න.
2. බොජුන් හලේ පවතින ආහාර වල තිබිය යුතු ගුණාංග 02 ක් ලියන්න.
3. තිළිණිගේ මිත්තනිය සඳහා අවශ්‍ය වන පෝෂණ අවශ්‍යතා 02 ක් ලියන්න.
4. බොජුන් හල සාර්ථකව පවත්වා ගැනීමට ඔවුන් තුල පවතින හිතකර ආකල්ප 02ක් ලියන්න.
5. භෝජනාගාරයට යෝග්‍ය මේස දරණුවක් තිළිණි විසින් සකස් කරන්නේ නම් ඒ සඳහා යෝග්‍ය මෝස්තරයක් ඇඳ දක්වන්න.
6. ඇය විසින් සැකසූ මේස දරණුව පිරිපුන් බව ඇති කිරීමට ගනු ලබන ක්‍රියා මාර්ගය සඳහන් කර එය කෙටියෙන් පහදන්න.
7. භෝජනාගාරය මනා සංවිධානයකින් යුක්ත බවට දැකිය හැකි ලක්ෂණ 02ක් සඳහන් කරන්න.
8. අලවිය සඳහා තබා ඇති ඇසුරුම් කළ ආහාරයේ ලේබල් තුල තිබිය යුතු ලක්ෂණ 04ක් ලියන්න.
9. අලවිය සඳහා තැබිය හැකි පරිරක්ෂිත ආහාර වර්ග 02ක් ලියන්න.
10. මෙම පවුලේ දියුණුව සඳහා අවශ්‍ය වන සමාජීය අවශ්‍යතා 02 ක් ලියන්න.

(ලකුණු : - 2 බැගින් 20 යි)

02. i) ඇදුම් නිර්මාණය සඳහා පතරම සැකසීමේ දී සැලකිය යුතු කරුණු 03ක් සටහන් කරන්න.
(ලකුණු : - 03)

ii) ඇදුමක් මැසීමට පෙර රෙද්දක් පෙර පිරියම් කිරීමට සිදුවිය හැකි අවස්තා 03ක් සඳහන් කරන්න.
(ලකුණු : - 03)

iii) පහත සඳහන් මැහුම් ක්‍රම පහදන්න.

A – හතරැස් කර සඳහා හැඩ පෝරුව යෙදීම

B – ආරෝපණ මැස්ම

(ලකුණු : - 04)
(මුළු ලකුණු : - 10 යි)

03. i) වැඩිහිටි වියේ කැල්සියම් ඌණතාවය නිසා ඇතිවන රෝගී තත්වය නම් කර එය ඇතිවීමට බලපාන හේතු 02 ක් සඳහන් කරන්න.

(ලකුණු : - 03)

ii) ෂෝට් ක්‍රස්ට් පේස්ට්‍රිය භාවිතා කර සෑදිය හැකි ළමා වියේ දරුවෙකු සඳහා යෝග්‍ය ආහාරයක් නම් කරන්න.

(ලකුණු : - 03)

iii) යොවුන් වියේ පසුවන දියණිය සඳහා යෝග්‍ය ප්‍රෝටීන් පරිපූරණය වූ උදය ආහාර වේලක් හා දිවා ආහාර වේලක් සඳහන් කරන්න.

(ලකුණු : - 04)

(මුළු ලකුණු : - 10 යි)

04. i) පහත සඳහන් පරිරක්ෂණ උපක්‍රම වලින් ආහාර පරිරක්ෂණය කරන ක්‍රම සහ මූලධර්ම පැහැදිලි කරන්න.

- විජලනය
- පරිරක්ෂක කාරක භාවිතය
- වැඩි උෂ්ණත්වය යෙදීම (ලකුණු : - 03)

ii) ඉහත පරිරක්ෂක උපක්‍රම භාවිතයේ දී සැලකිය යුතු කරුණු 04 ක් සඳහන් කරන්න.

(ලකුණු : - 04)

iii) මේද මුඩුවීම හඳුන්වන්න.

(ලකුණු : - 03)

(මුළු ලකුණු : - 10 යි)

05. i) දැනුම, ආකල්ප, කුසලතා යන සම්පත් පවුලේ දියුණුවට හේතුවන කරුණු 02 බැගින් ඉදිරිපත් කරන්න.

(ලකුණු : - 03)

ii) ආලෝකය හා වාතාශ්‍රය ගෘහසැලසුම් මූලධර්ම වේ. මුළුතැන්ගෙට ආලෝකය හා වාතාශ්‍රය ලබාගැනීමේ දී අවධානය යොමුකල යුතු කරුණු මොනවාද?

(ලකුණු : - 03)

iii) කලා මූලිකාංග අනුව තම ගෙවත්ත දැකුම්කලු ගෙවත්තක් බවට පත්කරගැනීමට දිය හැකි යෝජනා 04 ක් ලියන්න.

(ලකුණු : - 04)

(මුළු ලකුණු : - 10 යි)

06. i) ප්‍රාථමික ලිංගික ලක්ෂණ හා ද්විතීයික ලිංගික ලක්ෂණවල වෙනස පහදන්න. (ලකුණු : - 03)

ii) ගර්භණී භාවයේ ලක්ෂණ තුනක් සඳහන් කර එම ලක්ෂණ ඇතිවීමට හේතු ඉදිරිපත් කරන්න.

(ලකුණු : - 03)

iii) ළදරුවාගේ සාමාජීය වර්ධනය ඇති කිරීම සඳහා දෙමාපියන් වශයෙන් ගතයුතු ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු : - 04)

(මුළු ලකුණු : - 10 යි)

07. i) ගර්භණී මවක් වීමට කායික පරිනතිය වැදගත්වේ. පැහැදිලි කරන්න.

(ලකුණු : - 03)

ii) ළදරුවකුට නිවසේ දී සිදුවිය හැකි අනතුරු 03 ක් සඳහන් කර ඒවා වලක්වා ගැනීමට ගතයුතු පියවර ඉදිරිපත් කරන්න.

(ලකුණු : - 04)

iii) ඉපදී මුල් මාස කිහිපය තුළදී මිහිරි නාදය සමඟ චලනය වන වර්ණවත් ක්‍රීඩාභාණ්ඩ ලබා දීම දරුවාගේ සංවර්ධනයට හේතුවන කරුණු 04ක් ඉදිරිපත් කරන්න.

(ලකුණු : - 03)

(මුළු ලකුණු : - 10 යි)